**ශ්‍රී ලංකා පදනම - 2017**

**--------------------------------**

ශ්‍රී ලංකා පදනමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් පදනමේ සභාපති වෙත 2018 මැයි 15 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම් ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

---

ප්‍රමිතයෙහි 37 ඡේදය ප්‍රකාරව සේවාවන් සැපයීමේ හෝ වෙනත් කටයුතු කරගෙනයාමේදී ඇති ආවේනික අවිනිශ්චිතතාවයන් සඳහා වෙන්කිරීම් සිදුකිරීමේදී ආසන්නතම හා විශ්වාසදායි තොරතුරු පදනම් කරගෙන විනිශ්චයන් යොදා ගත යුතුයි. එසේ වුවද, ලැබිය යුතු ශේෂයන් සඳහා අඩමාන ණය වෙන් කිරීමේදී එපරිදි වූ විනිශ්චයන් යොදා නොගෙන ලැබිය යුතු මුළු ශේෂයටම පොදු ප්‍රතිශතයක් භාවිතා කරමින් අඩමාන ණය වෙන් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයෙහි 40 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේදී පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස තෝරාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ වටිනාකම දැක්වීමේ දී පිරිවැය ආකෘතිය හා ප්‍රත්‍යාගණන ආකෘතිය යන දෙකම යොදා ගෙන තිබුණි.

(ii) ප්‍රමිතයෙහි 49 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට එම මුළු වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු.40,327,280 ක් වූ මෝටර් රථ 12 කින් මෝටර් රථ 06 ක් පමණක් රු.21,300,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණනය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කරන ලද වාහන දෙකක අගය ගිණුම් ගත නොකිරීම හේතුවෙන් එම වාහන අගය සහ ප්‍රත්‍යාගණන සංචිතය රු.4,767,166 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය නොකරන ලද වාහන හතරක් උපකල්පිත ප්‍රත්‍යාගණන අගයන් මත ගිණුම් ගත කිරීම හේතුවෙන් වාහන අගය සහ ප්‍රත්‍යාගණන සංචිතය රු.11,800,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති පිරිවැය රු.174,257,291 ක් හා වර්ෂය තුලදී රු.2,630,841 ක් වැයකර වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීම වෙනුවට රක්ෂණය කිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී රු. 650,000,000 කට පෞද්ගලික පාර්ශවකරුවෙකු විසින් කරන ලද තක්සේරු වටිනාකම ප්‍රත්‍යාගණන අගය ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) පසුගිය වර්ෂයේ දී පුවත්පත් දැන්වීමක් පළ කිරීම වෙනුවෙන් දරන ලද රු.56,625ක වියදම එම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 හා 2013 වර්ෂ වලදී සේවය අවසන් කළ නිලධාරින් 6 දෙනෙකුගෙන් පදනම් ආයතනය වෙත අයවිය යුතු ශේෂය, මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා ණය ලිපි ගොණු අනුව වූ ශේෂ අතර රු 79,065ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ගැමි ගෙදර ව්‍යාපෘතියේ කෙරිගෙන යන වැඩ වටිනාකම රු.173,900 ක් වූ අතර ලෙජරය අනුව එම වටිනාකම රු128,900 ක් වූයෙන් රු.45,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

2005 වර්ෂයේ සිට පැවත එන රු.289,196 ක් හා 2015 වර්ෂයේ සිට පැවත එන රු.189,588 ක් වූ අවිනිශ්චිත ගිණුම් 2 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

සම්පත් දායකයින් ලෙස පත්වීම් ලිපි නිකුත් නොකල නිළධාරීන් 10 දෙනෙකු කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිළධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 02 කට සම්පත් දායකයින් ලෙස සම්බන්ධ කරගෙන දීමනා ලෙස රු. 569,900 ක් ගෙවා තිබුණි.

**2.2.6 ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය වූ රු. 15,356,258 ක් තුල විවිධ,අධ්‍යාපන හා ව්‍යාපාර සංවර්ධන ඒකකයේ ණයගැතියන්ගෙන් අයවිය යුතු වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර ණය ශේෂය රු.4,511,762 ක් විය.

(ආ) වර්ෂ 2006– 2009 කාල පරිච්ඡේදයට අදාලව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රදවා ගැනීම් බදු ලෙස රු.1,375,812 ක් ලැබිය යුතු ගිණුම්වල දක්වා තිබුණද, එම වටිනාකම නිරවුල් කර ගැනිමට සමාලෝචිත වර්ෂය අවසානයටද කටයුතු කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.1.6 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණිත දිනය වූ 2018 ජුනි 08 දින වන විටද, නිමකර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ)2006 දෙසැම්බර් 22 දිනැති අංක 2004/ප්‍රස/1 (2016 සංශෝධිත) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛය 3.1 හා 3.2 වගන්තිය | පුස්තකාලය භාරව සිටි නිළධාරිනිය 2017 දෙසැම්බර් මාසයේ ස්ථාන මාරුවී ගියද, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාන මාරුවී යාමට මාස 03 කට පෙර හෝ වර්ෂය අවසානයට පුස්තකාල පොත් පිළිබඳ වාර්ෂික තොග සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,906,195 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,139,359 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයහි රු.9,045,554 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම රු.3,731,707 කින් වැඩිවීම හා සැපයුම් හා පරිභෝජන,නඩත්තු හා අනෙකුත් මෙහෙයුම් වියදම් රු.7,229,770 කින් අඩුවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013,2014 වර්ෂවලදී අතිරික්තයක් පැවතියද, 2015 වර්ෂයේදී එය රු.16,935,858 ක ඌනතාවයක් බවට පත්ව තිබූ අතර, 2016 වර්ෂයේදී එම ඌනතාවය රු.7,139,359 ක් දක්වා අඩුවී 2017 වර්ෂයේදී රු.1,906,195 ක අතිරික්තයක් බවට වර්ධනය වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.107,804,833 ක් වූ දායකත්වය වාර්ෂිකව උච්චාවචනය වෙමින් 2017 වර්ෂයේදී රු.128,168,715 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර විගණනයට ඉදිරිපත් කර තිබුණද එම සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ජේදයේ අවශ්‍යතා වලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදි සැලසුම්කර පවත්වා තිබූ වැඩමුළු, සහතික පත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා ප්‍රමාණය සියයට 37 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වැඩමුළු, සහතික පත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා 90 ක් පැවැත්වීම වෙනුවෙන් ස්ථිර කාර්ය මණ්ඩලයේ කථිකාචාර්යවරුන් 12 ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් එක් කථිකාචාර්යවරයෙක් ඇතුළු කථිකාචාර්යවරුන් 13 දෙනෙකුගේ දේශන සහභාගිත්වය පැය 2773ක් වූයෙන් එක් කථිකාචාර්යවරයෙකුගේ වාර්ෂික සාමාන්‍ය දේශන පැය ගණන 213ක් විය. කෙසේ වුවද, මෙම පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් වර්ෂය සඳහා වූ මුළු දේශන පැය 10440 කින් පැය 7767 ක් බාහිර කථිකාචාර්යවරුන්ගෙන් ලබාගෙන තිබීමෙන්, පදනම් ආයතනයේ කථිකාචාර්යවරුන්ගේ හා බාහිර කථිකාචාර්යවරුන්ගේ දේශන සඳහා සහභාගිත්ව පැය අනුපාතය 1:3ක් විය. ඒ අනුව ආයතනයේ කථිකාචාර්යවරුන් සම්පූර්ණයෙන් දේශන පැය සඳහා සහභාගි වූ බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 2016 වර්ෂයේදී රාජ්‍ය නොවන සංවිධානයක් විසින් රූපවාහිනි වැඩසටහනක් සකස් කිරීමට ලබා දුන් ප්‍රතිපාදන වලින් ඉතිරි වූ රු.704,676 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයටද නිරවුල් කිරීමට කටයුතු නොකර විලම්භිත ආදායම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාර්ය නියමතා පදනම මත බඳවාගත් නිලධාරිනියකු හා දෛනික වැටුප් ලබන නිලධාරිනියකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් වෙත දායක මුදල් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී හිඟදායක මුදල් සහ අධිභාර ලෙස රු.214,530 ක් ගෙවා තිබුණි.

## 4.3 අනාර්ථික ගනුදෙනු

නව ගොඩනැගිල්ලේ ටෙරසය ව්‍යාප්ත කිරීම (Extension for terrace ) සඳහා 2016 සැප්තැම්බර් 19 දින රු.4,493,740 කට ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත්තුවේ සැලසුම්වල පැවති සංකීර්ණතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබූ බැවින් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ලබාදී තිබුණු අත්තිකාරම් මුදල රු.898,748 ක් හා ඉදි කරන ලද කොටස් ගලවා ඉවත් කිරීම වෙනුවෙන් ගෙවන ලද රු.145,176 ක් වශයෙන් එකතුව රු.1,043,924 ක වියදම් නිෂ්ඵල වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 154 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 129 ක් වීමෙන් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 27 ක් හා ද්විතික මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය විය. මෙම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටද, කටයුතු කර නොතිබූ අතර 2015 අප්‍රේල් සිට පුරප්පාඩුව පැවතුණු පුස්තකාලාධිපති තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු 2018 ජුලි 20 දින දක්වා බඳවා ගෙන නොතිබුණි.

## 5 තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 'න්‍යාය පත්‍රය' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ඔවුන්ගේ විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පදනම් ආයතනය විසින් නිකුත් කර තිබූ අභ්‍යන්තර චක්‍රලේඛ/ මාර්ගෝපදේශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා පදනම් ආයතනය, තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය අනුව වූ තිරසාර සංවර්ධන අරමුණු 17 පිළිබඳ නිසි දැනුවත් වීමකින් තොරව අරමුණු තුනක් සඳහන් කර තිබුණද, ඉන් අරමුණු දෙකක් පමණක් තිරසාර අරමුණු බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් හඳුනාගෙන තිබූ ස්ත්‍රී පුරුෂ සමානාත්වයට අනුකූල වූ අයවැයකරණය සහ අබාධිත පුද්ගලයන් සවිබල ගැන්වීමේ අරමුණු දෙක ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබුණ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

**ප්‍රසම්පාදන කළමනාකරණය**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ණයගැති පාලනය | ශාලා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් කොන්දේසි ප්‍රකාර කටයුතු නොකිරීම නිසා ණය අය කර ගැනීම ප්‍රමාද වීම. |
| (ආ) පරිගණක පද්ධතිය | යම් නිශ්චිත දිනකට පාඨමාලා හිඟ ගාස්තු ශේෂය හඳුනාගත හැකිවන පරිදි පරිගණක පද්ධතිය පවත්වා නොගැනිම. |
| (ඇ)පාඨමාලා සම්බන්ධ වාර්තා සැකසීම | සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ සමහර පාඨමාලා වෙනුවෙන් තත්‍ය පිරිවැය වාර්තා සකස් කර නොතිබීම සහ වැඩමුළු ඇස්තමේන්තුකරණයේදී සියළු සංරචකයන් පිළිබඳ අවධානය යොමු නොකිරීම. |
| (ඈ) අත්තිකාරම් පියවීම | 2001 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබාදී තිබූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) පුස්තකාල පොත් නඩත්තුව | සුදුසුකම් නොලත් නිලධාරීන් පුස්තකාලය භාරව පත්කර තිබීම හේතුවෙන් බැහැර දෙන හා විමර්ශන පොත් නිසි ලෙස අසුරා තැබීම, පොත් බැහැර දිම හා ආපසු ලබා ගැනිම, ප්‍රමාද ගාස්තු අයකර ගැනිම ප්‍රතිග්‍රහන ලේඛනයට සියලුම පොත් ඇතුලත් කිරීමේ කටයුතුවල අඩුපාඩු සිදුවී තිබුණි. |